*සැ. යු.* - 2021.06.25 වැනි දින පළ වූ අංක 2234 දරන ගැසට් පත්‍රයේ I : III, II, III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,235 - 2021 ජූලි මස 02 වැනි සිකුරාදා - 2021.07.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1432 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1433 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1435 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1437 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ජූලි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**යෝජනා කැඳවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**විදුලිබල අමාත්‍යාංශය**

ලංකා විදුලිබල මණ්ඩලය

**ජාත්‍යන්තර තරගකාරි ලංසු කැඳවීම (ICB)**

කෙරවලපිටියෙහි මෙගා වොට් 300 ක ද්‍රවීකෘත ස්වභාවික වායු සංයුක්ත චක්‍ර දෙවන විදුලි බලාගාරය ඉදිකිරීම, අයිතිය පවත්වාගෙන යාම සහ පැවරීම යන පදනම මත (Build, Own, Operat and Transfer basis) ස්ථාපනය කිරීම.

යෝජනා කැඳවීමේ ලේඛන අංකය : CEB/AGM(TR)DGM (PPD)/ LNG2-2020

යෝජනා භාර ගැනීමේ අවසන් දිනය සහ වේලාව : 2021 සැප්තැම්බර් මස 13 වැනි දින පැය 11.00 ට

1. අමාත්‍යමණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙ. වො. 300 ක ස්වභාවික වායු සංයුක්ත චක්‍ර බලාගාරයක් සංවර්ධනය කිරීම සඳහා අපේක්ෂිත යෝජකයන් වෙතින් යෝජනා කැඳවනු ලැබේ. මෙම බලාගාරය යෝජිත කි. වො. 220 කෙරවලපිටිය ග්‍රිඩ් උප පොළට සම්බන්ධ කළයුතු අතර එය, ඉදිකර, අයිතිය පවත්වාගෙන යමින් ක්‍රියාත්මක කර අයිතිය පැවරීම (BOOT) යන පදනම මත ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2. සාර්ථක ව්‍යාපෘති යෝජක විසින් පහත කරුණු සපුරාලිය යුතු ය.

* විදුලි බලාගාරය සැලසුම්කරණය, මුදල් යෙදවීම, ප්‍රසම්පාදනය, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම, නඩත්තු කිරීම සහ අවුරුදු 25 ක සංයුක්ත චක්‍ර බලාගාරය ක්‍රියාකාරිත්වයෙන් පසු පැවරීම.

* ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබාදෙන ඉඩම් කැබැල්ලෙහි සීමාංකනය කර ඇති මායිම් තුළ ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම.

* විදුලි ජනනය කරන ස්ථානයේ සිට උප පොළ දක්වා වන පරිනාමක, ආරක්ෂණ පද්ධති සහ විදුලිමණු සඳහා වන වියදම ද ඇතුළත්ව යෝජිත කි. වො. 220 කෙරවලපිටිය ග්‍රිඩ් උප පොළ හා විදුලි බලාගාරය අන්තර් සම්බන්ධ කිරීමට අදාළ සියලුම වියදම් දැරීම.

* සියලුම පාරිසරික යෝග්‍යතා, රජයේ අනුමැති සහ ව්‍යවස්ථාපිත බලපත්‍ර ලබා ගැනීම.

* ඉහත සඳහන් විදුලි බලාගාරය වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමග බලශක්ති මිල දී ගැනීමේ ගිවිසුමකට එළැඹිය යුතු ය. බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් කාලය සංයුක්ත චක්‍ර මෙහෙයුම් ආරම්භක දින සිට අවුරුදු 25ක් වේ.

3. අපේක්ෂිත ව්‍යාපෘති යෝජකයන්, වෙළුම් හයකින් සමන්විත යෝජනා කැඳවීමේ ලේඛනය, යෝජනා භාර ගැනීමේ අවසන් දිනට ප්‍රථමයෙන් වන දින තිහක් (30) දක්වා වැඩ කරන දිනවල පැය 9.00 සිට පැය 15.00 දක්වා අතර වූ කාලය තුළ නැවත නොගෙවනු ලබන ශ්‍රී ලංකා රු. 400,000.00 ක ගාස්තුවක් මුදලින් හෝ සාමාන්‍යාධිකාරි, ලංකා විදුලිබල මණ්ඩලය යන නමට ලියන ලද බැංකු අයිරාවක් මගින් ගෙවීම සිදුකර පහත ලිපිනය දරන ස්ථානයෙහි පිහිටි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පුද්ගලික විදුලිබල සංවර්ධන) කාර්යාලයට පැමිණ ලබාගත යුතු ය.

*නැතහොත්*

යෝජනා කැඳවීමේ ලේඛනය කුරියර් සේවාව මගින් ලබාගැනීමට අවශ්‍ය නම්, අපේක්ෂිත ව්‍යාපෘති යෝජකයන් සාමාන්‍යාධිකාරි, ලංකා විදුලිබල මණ්ඩලය යන නමට ලියන ලද ශ්‍රී ලංකා රු. 400,000.00 ක (දේශීය බෙදා හැරීම සඳහා) බැංකු අයිරාවක් ද සමග ලිඛිත අයදුම්පතක් මගින් තම ඉල්ලීම පහත දැක්වෙන ලිපිනයට යොමු කළ යුතු ය. යෝජනා කැඳවීමේ ලේඛනය කුරියර් සේවාව මගින් එවනු ඇත. බෙද හැරීමේ දී සිදුවන අස්ථානගත වීම් හෝ ප්‍රමාද වීම් සම්බන්ධයෙන් ලං. වි. ම. වගකියනු නොලැබේ.

*තවද,*

යෝජනා කැඳවීමේ ලේඛනය කුරියර් සේවාව මගින් විදේශීය අපේක්ෂිත ව්‍යාපෘති යෝජකයන් සඳහා ලබා ගැනීමට අවශ්‍ය නම්, නැවත නොගෙවනු ලබන එ. ජ. ඩො. 2,300.00 ක මුදලක් පහත විස්තර දක්වා ඇති සාමාන්‍යාධිකාරි, ලංකා විදුලි බල මණ්ඩලය ගිණුමට බැරකර එම විස්තර සමග තම ඉල්ලීම විද්‍යුත් තැපැල dgmppd.tr@ceb.lk ට යොමුකළ යුතු අතර ගෙවීම් තහවුරු කර ගැනීමෙන් පසු යෝජනා කැඳවීමේ ලේඛනය කුරියර් සේවාව මගින් එවනු ඇත. බෙද හැරීමේ දී සිදුවන අස්ථානගත වීම් හෝ ප්‍රමාද වීම් සම්බන්ධයෙන් ලං. වි. ම. වගකියනු නොලැබේ.

ලබන්නා : General Manager, Ceylon Electricity Board
ලිපිනය : 50, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
ගිණුම් අංකය : 204100130085135
SWIFT කේතය : PSBKLKLX023
බැංකුවේ නම : People's Bank Headquarters Branch
බැංකුවේ ලිපිනය : 75, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
ලේඛන අංකය : CEB/AGM (TR)/DGM (PPD)/LNG2-2020

4. යෝජනා කැඳවීමේ ලේඛනය ලං. වි. ම. වෙබ් අඩවියෙන් ද පරීක්ෂා කළ හැකි ය. http ://www.ceb.lk

5. අපේක්ෂිත ව්‍යාපෘති යෝජකයන්ට වැඩිදුර තොරතුරු විමසීම සඳහා, යෝජනා කැඳවීමේ ලේඛනය පරීක්ෂා කිරීම සඳහා හෝ යෝජනා කැඳවීමේ ලේඛනය මිලදී ගැනීම සඳහා පහත සඳහන් අය සම්බන්ධ කරගත හැකි ය.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි,
පුද්ගලික විදුලිබල සංවර්ධන ශාඛාව,
ලංකා විදුලිබල මණ්ඩලය,
2 වන මහල, G. O. B. A. ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 00200,
ශ්‍රී ලංකාව.
දුරකථන/ෆැක්ස් + 94112338249
විද්‍යුත් ලිපිනය : dgmppd.tr@ceb.lk

6. යෝජනා කැඳවීමේ ලේඛනයට අනුව පිළියෙල කරන ලද යෝජනාව, යෝජනා කැඳවීමේ ලේඛනයෙහි I වන වෙළුමෙහි 3.20 කොටස අනුව මුද්‍රා තබන ලද කවරයක බහා 2021 සැප්තැම්බර් මස 13 වැනි දින පැය 11.00 ට (යෝජනා භාර ගැනීමේ අවසානය) හෝ ඊට පෙර පහත ලිපිනයට යොමු කළ යුතු ය. යෝජනා භාර ගැනීමේ අවසානයට පසු ලැබෙන යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද
සාකච්ඡා සම්මුති කමිටුව
විදුලි බල අමාත්‍යාංශය,
අතිරේක සාමාන්‍යාධිකාරි (සම්ප්‍රේෂණ) බාරේ,
4 වන මහල, ලංකා විදුලිබල මණ්ඩල ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,
අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 00200, ශ්‍රී ලංකාව.

7. යෝජනා භාර ගැනීමේ දිනය සහ වේලාව ඉකුත් වූ විගස ඉදිරිපත් කර ඇති යෝජනා අතිරේක සාමාන්‍යාධිකාරි (සම්ප්‍රේෂණ) කාර්යාලයේ දී ව්‍යාපෘති යෝජකයන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරිපිට විවෘත කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරි,
ලංකා විදුලිබල මණ්ඩලය.

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවෙහි සභාපති වෙනුවට.

ලංකා විදුලිබල මණ්ඩලය.

07-63

---

# බඩු බාහිරාදිය විකිණීම

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මුතූර්**

මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2021.07.10

01. මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2021.07.10 වැනි දින පෙ. ව. 9.00 (am) ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු ය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත්කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

| | *වෙන්දේසිය නියමිත භාණ්ඩ* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | වැලි | 105 කියුබ් |
| 2. | පස් | 03 කියුබ්. |

එච්. එම්. තස්නීම් ෆව්සාන්,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මුතූර්.

07-39

## මහෙස්ත්‍රාත් අධිකරණය - මඩකලපුව

### ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවල දී රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2021.07.10 වැනි දින පෙරවරු 9.00 ට මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට නියමිතය.

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත්කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබාගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත්කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳ කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසිය සිදුකරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

ඒ. සී. රිස්වාන්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මඩකලපුව.

2021 ජුනි මස 28 වැනි දින.

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය

| *අංකය* | *නඩු අංකය* | *ලියාපදිංචි අංකය* | *භාණ්ඩ* | *අයිතම ගණන* |
|---|---|---|---|---|
| 1. | 63377/E/20 | EP AAZ - 9998 | ත්‍රීරෝද රථය | 01 |
| 2. | 48700/ MT/17 | EP BBX - 5746 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 3. | 50772/ E/18 | EP BDK - 6293 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 4. | 57309/ PC/19 | EP BAQ - 1836 | යතුරු පැදිය | 01 |
| 5. | 61907/ MT/20 | EP BFL - 8066 | යතුරු පැදිය | 01 |
| 6. | 62154/ MT/20 | EP HS - 8070 | යතුරු පැදිය | 01 |
| 7. | 62408/ MT/20 | EP GX - 8347 | යතුරු පැදිය | 01 |
| 8. | 38983/ PC/16 | | සිලින්ඩරය | 01 |
| 9. | 63455/S/21 | | සවල් | 01 |
| 10. | 63287/ S/21 | | සවල් | 01 |
| 11. | 63288/ S/21 | | සවල් | 01 |
| 12. | 63290 / S/21 | | සවල් | 01 |
| 13. | 63415/ S/21 | | සවල් | 01 |
| 14. | 63339/ S/21 | | සවල් | 02 |
| 15. | 62481/ S/21 | | සවල් | 01 |
| 16. | 63342/ S/21 | | සවල් | 02 |
| 17. | AR/216/21 | | යකඩ පයිප්ප | 05 |

07-116

**දැන්වීමයි**

කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ (වැලි, පස් හා බොරළු) ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ (වැලි, පස් හා බොරළු) **2021.07.17 වැනි දින පෙ. ව. 9.00** ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. භාණ්ඩ සම්බන්ධයෙන් යමකට හිමිකම් පාන්නෙකු වේනම් වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

2. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

3. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

4. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

5. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන්නේ නම් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

| *වෙන්දේසියට නියමිත භාණ්ඩ* | | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | ගංගා වැලි | කියුබ් 04 |
| 2. | පස් | කියුබ් 35 |
| 3. | බොරළු | කියුබ් 03 |

එම්. එස්. එම්. සම්සුදීන්,
මහෙස්ත්‍රාත්.

මහෙස්ත්‍රාත් අධිකරණය,
කල්මුණේ.

07-40

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2022 වර්ෂය**

2022 වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට 2022 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2021.08.25 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන රා තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන්

වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැළැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

/04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2021.08.25 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2021.09.28 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසට වැඩි කොටසක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩී. එම්. එන්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2021 ජුනි මස 23 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

**2022 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

*ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2022.01.01 වැනි දින සිට 2022.12.31 වැනි දින දක්වා*

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* | *ටෙන්ඩර් තැන්පත්* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගල අංක 02 | ලුණුගල | ලුණුගල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස අංක 02 හි වරිපනම් අංක 219 දරන කුරුවි කුඹුරු වත්ත | පෙ.ව. 11.00ට<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රුපියල් 5,000 | 2021.08.25 පෙ.ව. 10.30 |

මහදෝව වත්තේ සීමාව තුළ 2022 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍රය අලුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2021.08.25 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය.

07-64

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

කැනඩාවේ, 163 මර්කරි පාර, එටෝබිකෝ ඔන්ටාරියෝහ M9W3H7 පදිංචි ඒකනායක මුදියන්සේලාගේ තිලකසිරි ඒකනායක වන මා විසින් සුදර්ශන මාවත, කැන්දගොල්ල, මාවතගම පදිංචි ඒකනායක මුදියන්සේලාගේ ලසන්ත චමීර ඒකනායක යන අයට 2019 මාර්තු මස 14 වැනි දින පවරා දුන් ඇටෝර්නි බලපත්‍රය අද දින සිට බල රහිත කර ශුන්‍ය කර අවලංගු කරන බව ශ්‍රී ලංකා රජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ඒකනායක මුදියන්සේලාගේ තිලකසිරි ඒකනායක.

07-41

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 11, හෙට්ටි වීදිය, අංක 247 දරන ස්ථානයේ පදිංචිව සිටි සහ දැනට කේ. එම්. එන්. එන්. නිවස, වෙට්ටියාර් මාවත, සෙම්බනූර්, සිවගංගා දිස්ත්‍රික්කය, තමිල්නාඩු, ඉන්දියා හි පදිංචි සාවන්නා නාච්අප්පා කුමාරප්පන් වෙට්ටියාර් (ගමන් බලපත්‍ර අංක L 4149011) වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අඹගහ හේවගේ දොන් මංජුලා දමයන්ති මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 272 සහ වර්ෂ 2009ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින ලියා සහතික කරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව 8956 දරන දිනපොතේ 25 කාණ්ඩයේ 48 දරන පත් ඉරුවේ ලියාපදිංචි කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස, පුත්තලම, මදුරංකුලිය, පන්සල පාර, අංක 176 දරන ස්ථානයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 603393791 V සිරිමැදුරලාගේ චන්ද්‍රසිරි යන අයව පත් කළෙමි. මෙකී අංක 272 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව මෙයින් දැනුම් දෙනු ලබන අතර, තවදුරටත් මෙකී විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ කිසිදු වලංගුභාවයක් හෝ නීතිමය ශක්‍යතාවයක් නොමැති බවටත් සියල්ලෝ ම මින් දැනගත යුතු ය.

රත්නායක මුදියන්සේලාගේ කුලසේන,
සාවන්නා නාච්අප්පා කුමාරප්පන් වෙට්ටියාර් යන අයගේ
ඇටෝර්නි බලකාර.

07-42

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම, 2021 මැයි 01 වැනි දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : කොන්ස්ටෘවල් කැපිටල් (පීවීටී) එල්ටීඩී
සමාගම ලියාපදිංචි අංකය : පීවී 00238924
ලියාපදිංචි කාර්යාල ලිපිනය : 63/5 අම්බලන්වත්ත පාර, හීනටිකුඹුර, 10120 ශ්‍රී ලංකා.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කොන්ස්ටෘවල් කැපිටල්,
සමාගමේ ලේකම්.

63/5, අම්බලන්වත්ත පාර,
හීනටිකුඹුර, 10120 ශ්‍රී ලංකා.

07-93

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

රත්මලාන රජමාවත, අංක 9/8 හා වර්තමාන ලිපිනය දෙහිවල නැදිමාල බෙල්ලන්තර පාර අංක 14 - 2/1 හි පදිංචි උපාලි ශ්‍රී ෂාන්ත ගුණසේකර (ජා. හැ. අංක 590630284 V) වන මා ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා පොදු මහජනතාවට මින් දැනුම් දෙන්නේ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. ප්‍රීසන් ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 1917 දරන හා 1992 අගෝස්තු මස 17 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් රත්මලාන, රජමාවත, අංක 9/8 හි පදිංචි සිරිපාල පරනවිතාන (ජා. හැ. අංක 194615200189) වෙත මා විසින් ප්‍රදානය කළ ඇටෝර්නි බලය මින් අවලංගු හා බලරහිත කරනු ලබන බවත් අද දින සිට ඉහත ඇටෝර්නි බලකරු එම ඇටෝර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිවකට මාගේ වගකීමක් නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සියළු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

උපාලි ශ්‍රී ෂාන්ත ගුණසේකර.

2021.05.16

07-94

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට් පිටුවකින්* අඩකට | ... | ... | ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට් පිටුවකට* | ... | ... | ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** රු. ශ. | **තැපැල් ගාස්තුව** රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2021** වර්ෂය | | | |
| **ජූලි** | 2021.07.02 | සිකුරාදා | 2021.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.09 | සිකුරාදා | 2021.06.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.16 | සිකුරාදා | 2021.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.22 | බ්‍රහස්පතින්දා | 2021.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.30 | සිකුරාදා | 2021.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2021.08.06 | සිකුරාදා | 2021.07.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.08.13 | සිකුරාදා | 2021.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.20 | සිකුරාදා | 2021.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.27 | සිකුරාදා | 2021.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2021.09.03 | සිකුරාදා | 2021.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.10 | සිකුරාදා | 2021.08.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.17 | සිකුරාදා | 2021.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.24 | සිකුරාදා | 2021.09.10 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.